# පරිපාලනය

දූරාතීතයේ පටන් එනම් ක්‍රි.පූ 543 ට පෙර ආර්ය ශිෂ්ඨාචාරය ඇරඹුණු යුගයේද, මනා පරිපාලන ප්‍රදේශයක්ව පැවති මාතර රෝහණ රාජධානියේ සමෘධිමත් කලාපයක්ව තිබූ බවට ඓතිහාසික සාක්ෂි නොමදව ඇත. 15 වන සියවසෙහි කෝට්ටේ රාජධානිය කරවූ වීර පරාක්‍රමබාහු රජතුමා විසින් පාලනයේ පහසුව සඳහා සත් කෝරළය, සතර කෝරළය, තුන් කෝරළය, දෙනවක, රයිගම හා මාතර වශයෙන් පරිපාලන ප්‍රදේශ 6 කට බෙදා වෙන්කර තිබූ බව ඉතිහාසයෙන් හෙළිවේ. මාතර ප්‍රදේශය රජතුමා විසින් පත්කරන ලද පශිය නායකයකුගෙන් පාලනය වූ බව කියවේ.

ශ්‍රී ලංකාව විදේශීය ආක්‍රමණවලට ගොදුරුව පැවති අවධියේ පෘතිගීසීන් විසින් අගනා වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් මාතර හඳුනාගෙන කටයුතු කර තිබුණි. ප්‍රාදේශිය පාලකයන් තමා වෙත නැඹුරුකර ගැනීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් 1597 වන විට කෝට්ටේ රාජධානිය මුළුමනින්ම යටත් කරගත් පෘතුගීසීන්, සබරගමුව, සතර කෝරළය, සත්කෝරළය හා මාතර යනුවෙන් කොටස් හතරකට වෙන්කරන ලද්දේය. කෝට්ටේ රාජධානියට අයත් විශාලතම හා සමෘද්ධිමත් කළාපය වූ මාතර, “ මාතර දීපවානිය” නමින් ද හැඳන්වීය.

එවකට ප්‍රධානතම ප්‍රාදේශීය පාලකයා දිසාපති වශයෙන් හඳුන්වන ලද අතර , පෘතුගීසි පාලන සමයේ සිටි එකම සිංහල දිසාපති වූයේ දොන් ප්‍රනාන්දු සමරකෝන්, මාතර ප්‍රදේශයේ අයෙකි.කෝට්ටේ රාජධානියේ අනිකුත් පරිපාලකයන්ට වඩා කාර්යශූර හා දක්ෂතම පාලකයා වූ ඔහු නයිට් නාමයකින් ද පිදුම් ලබන ලදී. ප්‍රාදේශීය පාලනයේ සියලුම බලතල දැරූ ඔහුට සහාය වීම සඳහා ආදායම් පාලක නිළධාරීන්ද, එම කොට්ඨාශය තුළ ගම් මට්ටමින් විදානේ වරු ද, රාජකාරි කළහ. (උඩරට මොවුන් හැඳන්වූයේ කෝරළේ නමිනි) . වැඩවසම් ක්‍රමය තුළ රජුට සේවය කිරීම මාතර ප්‍රදේශය තුල ද පැවතින.

18 වන ශතවර්ෂයේ ලන්දේසි පාලනයට යටත්වූ පසුව මුහුදු බඩ ප්‍රදේශ ගාල්ල , කොළඹ , යාපනය වශයෙන් පාලන කොට්ඨාශ තුනකට බෙදාවෙන් කරන ලදී. ගාල්ල පරිපාලන කොට්ඨාශය වළවේ ගඟ සිට බෙන්තර ගඟ දක්වා විහිදුනු විශාල ප්‍රදේශයකට සීමාවූ අතර මාතර ද මීට අයත් විය. නැවත මාතර ආදායම් පාලක කොට්ඨාශ 05 කට බෙදා වෙන් කරන ලදී.

1789 දී මුහුදු බඩ ප්‍රදේශය ද , 1815 දී උඩරට ප්‍රදේශය ද , සිය පාලනයට නතු කරගත් ඉංග්‍රීසින් විසින්, ප්‍රදේශය පාලනය ක්‍රමවත් කිරීම පිණිස 1829 දී කොල්බෘක් කොමිසම පත්කරන ලදී. එම කොමිසමේ යෝජනා පරිදි නැවත බෙදා වෙන්කරන ලද පරිපාලන කොට්ඨාශ අනුව ආණ්ඩුව මගින් පාලනය වන පළාත් පාලන ආයතන පිහිටුවන ලදී. මෙම පළාත් වලට ඒජන්ත කෙනෙකු පත්කොට සෑම පළාතක් ම දිස්ත්‍රික්ක කිහිපයකට බෙදා උප ඒජන්ත වරයෙකු ද පත්කරන ලදී.

1833 වර්ෂයේදී බෙන්තර ගඟ සිට කුඹුක්කන් ඔය දක්වා ප්‍රදේශය  දකුණු පළාත නමින් පාලන කොට්ඨාශයක් බවට පත්විය.

මෙලෙස බිහිවූ දකුණු පළාත බෙන්තර ගඟ සිට කුඹුක්කන් ඔය දක්වා විහිදුනු  අතර, මෙය නැවත උප ඒජන්ත කොට්ඨාශ 05 කට බෙදන ලදී. ඒවා නම් ගාල්ල ,රත්නපුර , මාතර , පහල ඌව හා හම්බන්තොට වේ. එසේ නමුදු 1845 දී රත්නපුර සබරගමුව පළාතටද , පහල ඌව හා වෙල්ලස්ස මධ්‍යම පලාතටද , සම්බන්ධ කෙරිණි. නූතන දකුණු පළාත (මාතර, ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙන් සැදුම්ලත්) නියත වශයෙන්ම තීරණය වූයේ 1881 දී ය.

1890 පමණ වන විට පළාත් එජන්තට වග කියන උප ඒජන්ත කොට්ඨාශයක් වශයෙන් මාතර දිස්ත්‍රික්කය ක්‍රියාත්මක විය. උප ඒජන්ත වරයාට සහාය වීමට මාතර දිස්ත්‍රික්කය පරිපාලන කොට්ඨාශ 05 කට බෙදා මුදලිවරු පස් දෙනෙක් පත්කරන ලදී. එම මුදලිවරු යටතේ ගම් 10 කට එක් අයෙක් වශයෙන් විදානේ ආරච්චිවරු පාලන කටයුතු සඳහා සහාය විය. මෙම කොටසක් වලකඩ යනුවෙන් හඳුන්වන ලදී. ඔවුන් යටතේ ගම් මට්ටමින් "පොලිස් මුලාදැනී" තනතුරු ක්‍රියාත්මක විය. මේ ආකාරයේ ව්‍යුහයක් පැවති මාතර දිස්ත්‍රික්කයේ පාලනය තුලද, බ්‍රිතාන්‍ය යුගයේ සහමුලින්ම සාමකාමී පාලනයක් හා සශ්‍රීකත්වයක් දක්නට ලැබුණි. එවකට උසස්ම ප්‍රදේශීය මුළදැනී තනතුර වූයේ පත්තුවක් හෝ කෝරළයක් බාරව ක්‍රියාකල මුදලිවරයාය.

මාතර දිස්ත්‍රික්කයේ එවකට

1. වැලිගම කෝරළය
2. මොරවක් කෝරළය
3. ගඟ බඩ පත්තුව
4. වැල්ලබඩ පත්තුව
5. කන්දබඩ පත්තුව                                    බාරව මුදලිවරු ක්‍රියා කළහ.

දිස්ත්‍රික් ඒජන්තවරු විසින් ප්‍රදේශයේ උගත් ධනවත් පවුල් වලින් මුදලිවරු තෝරා ගන්නා ලදී. එසේම මුදලිවරු විසින් එම ප්‍රදේශයේ යහපත් ආර්ථික හා සමාජ තත්වයක් ලබා ඇති ගම් වැසියන් අතරින් තම නායකත්වයට සුදුසු යැයි පිළිගන්නා වූ ප්‍රභූ පවුල් වලින් විදානේ ආරච්චිවරු පත් කර ගන්නා ලදී. ඔවුන් මෙසේ ගොඩනගා තිබූ මෙම සමාජ තත්වය නිසා එකළ ග්‍රාමීය මට්ටමේ කෘෂිකර්මය නගා සිටුවීමට මෙන්ම සාමකාමී පාලනයක් ගෙනයාමට මෙය මහෝපකාරී විය.

1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමග පැන නැගුන වෙනස්කම් අනුව 1938 දී ප්‍රථම වරට තරඟ විභාගයකින් ආදායම් පාලක කොට්ඨාශ සඳහා පත්වී සිටි මුදලි තනතුරු අහෝසි වී ආදායම් පාලක

නිළධාරීන් පත් කෙරින. මාතර දිස්ත්‍රික්කයේ අවසානම මුදලිවරයා වශයෙන් එවකට ගඟබඩ පත්තුව පාලනය කරන ලද රත්නායක මුදලිවරයා හැඳින්විය හැකිය.

එසේම විදානේ ආරච්චි හා පොලිස් මුලාදැනි තනතුරු බිහිවිය. 1961 වසරේදී ගම්මුලාදැනි ක්‍රමයද වෙනස් කරන ලදී. තරඟ විභාගයකින් තෝරා ගන්නා ලද ග්‍රාම සේවක තනතුරු ඇතිවිය. මේ නිසා ආදායම් පාලක කොට්ඨාශ 5 ක් සඳහා ආදායම් පාලක නිළධාරීවරු 5 දෙනෙකු පත්වූ අතර, ගම් මට්ටමින් වසම් සඳහා ග්‍රාම සේවක පත්විය. ඔවුන් දිස්ත්‍රික් දිසාපතිවරයාට තම සේවය ඉටුකරන ලදී.මෙම සේවා තුලින් රටේ පරිපාලනය මනාව ඉෂ්ට වුවද සංවර්ධන කාර්යයන්හිදී දිසාපතිවරයාගේ දායකත්වය අවම විය. මේ බව වටහා ගත් ඩොනමෝර් පාලකවරු දිසාපතිවරයා රජයේ සංවර්ධන වැඩ කටයුතුවල දිස්ත්‍රික් සංවර්ධන නිළධාරියා වශයෙන් පත්කරන ලදී. මෙමගින් විශේෂයෙන් ජනතාවට අවශ්‍ය කෘෂිකාර්මික සංවර්ධන කටයුතු වේගවත් කිරීම බලාපොරොත්තු විය.

1948 දී නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකා ජනතාවට සර්ව ජන ඡන්ද බලය හිමි විය. ග්‍රාමීය ජනතාවගේ ප්‍රශ්න තේරුම් ගෙන කටයුතු කිරීමේ අවශ්‍යතාවය විශාල වශයෙන් පැන නැගිනි. එම නිසා පාලන තන්ත්‍රය ඒ සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රාදේශීය වශයෙන් පරිපාලනය විමධ්‍යගත කිරීමේ දෙවෙනි පියවර වශයෙන් 1973 දී දිස්ත්‍රික් දේශපාලන අධිකාරී ක්‍රමය ස්ථාපිත කරන ලදී. මෙතෙක් කල් පරිපාලන ආධිපත්‍යය පතුරුවාගෙන සිටි බලධාරීන් නිළධාරී ක්‍රමය දේශපාලනීකරණය කිරීමේ මූලික අඩිතාලම ලෙස දිස්ත්‍රික් දේශපාලන අධිකාරී ක්‍රමය හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැළසුම් කිරීම ,ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීමේ කටයුතු වලදී ජනතා සහභාගීත්වය පුළුල් කිරීමට මෙමගින් අපේක්ෂා කරන ලදී.

දේශපාලන අධිකාරියේ මූලස්ථානය මාතර කච්චේරිය වූ අතර, එහි ලේකම් වශයෙන් මාතර දිස්ත්‍රික්කයේ ඒජන්තවරයා නිළබලයෙන් පත්විය. ආදායම් පාලක නිළධාරී, සහකාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් තනතුර පසු කාලීනව වෙනස් විය.

මෙම ක්‍රමය තුල ද ග්‍රාමීය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හිඟ කම ප්‍රධාන ගැටලුවක් බවට පත්විය. මෙම තත්වය මගහැරවීම පිණිස විමධ්‍යගත අයවැය ක්‍රමය හඳුන්වාදීම මගින් දේශපාලන අධිකාරියේ බලය ශක්තිමත් කිරීමට හැකිවිය. මාතර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ මට්ටමින් වෙන්කර තිබූ විමධ්‍යගත අයවැය මුදල් සඳහා සංවර්ධන වැඩසටහන් සකස් කිරීමේදී ප්‍රාදේශීය උප දිසාපතිවරයා හා සමගාමීව කටයුතු කිරීමට දේශපාලකයන්ට මින් අවස්ථාව ලැබිණ.

කෙසේ වෙතත් මෙම වකවානුව වන විට මාතර දිස්ත්‍රික්කයේ ප්‍රදේශය ආදායම් නිළධාරී කොට්ඨාශ 5, 11 දක්වා වැඩි විය. එමෙන්ම කාර්යභාරය සලකා බලා පසුව මේවා උප දිසාපති කාර්යාල වශයෙන් නම් කරන ලදී.

1. වැල්ලබඩ පත්තුව නැගෙනහිර (දික්වැල්ල)
2. වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර (මාතර හා දෙවිනුවර)
3. ගඟබඩ පත්තුව දකුණ (තිහගොඩ)

4. ගඟබඩ පත්තුව උතුර (කඹුරුපිටිය)
5. කන්දබඩ පත්තුව බටහිර (මුලටියන)
6. කන්දබඩ පත්තුව නැගෙනහිර (හක්මණ)
7. මොරවක් කෝරළේ නැගෙනහිර (පස්ගොඩ)
8. මොරවක් කෝරළේ බටහිර (කොටපොල හා පිටබැද්දර)
9. වැලිගම කෝරළේ උතුර (අකුරැස්ස)
10. වැලිගම කෝරළේ දකුණ (මාලිම්බඩ)
11. වැලිගම කෝරළේ බටහිර (වැලිගම හා වැලිපිටිය)

ආදී වශයෙනි . ඒ සමගම වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර නැවත වැල්ලබඩ පත්තුව දකුණ (දෙවිනුවර ) වශයෙන් තවත් කොට්ඨාශයකට වෙන්විය. ග්‍රාම සේවක වසම් සංඛ්‍යාව 225 දක්වා වැඩිවිය.

1978 වසර වනවිට එවකට පැවති රජය විසින් දේශපාලන අධිකාරය, දිස්ත්‍රික් අමාත්‍ය ක්‍රමය යනුවෙන් වෙනස් කරන ලදී. මාතර දිස්ත්‍රික්කයේ ප්‍රථම දිස්ත්‍රික් ඇමතිවරයා වශයෙන් කීර්ති අබේවික්‍රම මහතා පත්විය. ඔහුගේ දිසා ලේකම් වශයෙන් දිසාපතිවරයා නිළ බලයෙන් පත්වූ අතර, මෙමගින් සංවර්ධන කාර්යන් පිළිබඳ තීරණ ගැනීමේදී පවත්නා වූ පරිපාලන රටාව වඩාත් නම්‍යශීලී කොට සුමට මගකට යොමු කිරීම බලාපොරොත්තු විය. මෙම ක්‍රමය තුළින් සංවර්ධන වැඩසටහන් සැළසුම් කිරීම මෙන්ම ක්‍රියාත්මක කිරීම ද සිදුකරන ලදී.

1981 වසර වන විට එවකට පැවති රජය දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය හඳුන්වා දෙන ලදී. මාතර දිස්ත්‍රික්කයේ ආසන 06 ක් සඳහා නියෝජිතයන් තෝරා පත්විය. ඔවුන්ගෙන් සැදුම්ලත් සංවර්ධන සභාව සඳහා සභාපති ඔවුන්ගේ මනාපය හා දේශපාලන බලය මත පත්කරගන්නා ලදී.

සෑම ග්‍රාම නිළධාරී වසමක් සඳහාම එක් මණ්ඩලයක් බැගින් ග්‍රාමෝදය මණ්ඩල 225 පිහිටු වීය. සෑම උප දිසාපති කොට්ඨාශයක් සඳහාම ප්‍රාදේශීය මණ්ඩල ස්ථාපනය කරන ලදී. මෙලෙස පිහිටුවන ලද සංවර්ධන සභා ක්‍රමය තුල ද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී දිසා ඇමතිවරයා හා දිස්ත්‍රික් සංවර්ධන සභා අතර පැවතියේ දුර්වල සම්බන්ධතාවයකි.

1987 වන විට ප්‍රදේශය පරිපාලනය විමධ්‍යගත කිරීමේ නවතම ඉදිරි පියවර වූ පළාත් සභා ක්‍රමය 1987 පළාත් සභා පනත මගින් එළිදැක්විනි. එමගින් මධ්‍යම රජයේ බලතල ප්‍රාදේශීය මට්ටමින් මුදාහැරීමට ශක්තිමත් අඩිතාලමක් වූ අතර , අද දක්වා මෙම ක්‍රමය ක්‍රියාත්මක වේ. මේ යටතේ පිහිටවූ දකුණු පළාත් සභාව ප්‍රධාන අමාත්‍ය හා ඇමති මණ්ඩලය 4 දෙනෙකුගෙන් සමන්විත විය. පළාත් සභාව සඳහා 1987 දී මාතර දිස්ත්‍රික්කයෙන් නියෝජිතයන් 07 දෙනෙක් මහජන ඡන්දයෙන් තෝරා පත්කරගන්නා ලදී.

1992 වන විට දිස්ත්‍රික්කයේ පරිපාලන ව්‍යුහයේ වෙනසක් දක්නට ලැබිණ. කච්චේරි ක්‍රමය අහෝසිවී කච්චේරිය, දිසා ලේකම් කාර්යාලය බවටත්, දිසාපති, දිසා ලේකම් බවටත් පත්විය. උප දිසාපති කොට්ඨාශ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ යනුවෙන් හඳුන්වන ලද අතර උප දිසාපති තනතුර, ප්‍රාදේශිය ලේකම් තනතුර බවට පරිවර්තනය විය. එසේම ග්‍රාම සේවක තනතුර, ග්‍රාම නිළධාරී තනතුර බවට වෙනස් විය. අකුරැස්ස හා දෙවිනුවර පැවති සුළු නගර සභා අහෝසි වී, මාතර , වැලිගම නගර සභා පමණක් නගර සභා ලෙසට නම් කෙරිණි. ග්‍රාමෝදය මණ්ඩලය අහෝසි වී මහජන ජන්දයෙන් පත්වන නියෝජිතයින්ගෙන් සැඳුම්ලත් ප්‍රාදේශීය සභා පිහිටුවන ලදී.

1992 වන විට මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ට අමතරව කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටබැද්දර යනුවෙන් උප කොට්ඨාශයක් ද , වැලිගම කොට්ඨාශයෙන් වැලිපිටිය යනුවෙන් උප කොට්ඨාශයක් ද, බෙදා වෙන්කරන ලදී. පසුව මෙම කොට්ඨාශ දෙකද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බවට පත්විය. 1999 අවසාන භාගය වනවිට මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රමාණය 16 දක්වා වැඩිවිය. කඹුරුපිටිය ප්‍රා.ලේ කොට්ඨාශයෙන් හා හක්මණ ප්‍රා.ලේ කොට්ඨාශයෙන් සුළු කොටසක් ද එක් කර කිරින්ද පුහුල්වැල්ල යනුවෙන්ද, අකුරැස්ස කොට්ඨාශයෙන් අතුරලිය යනුවෙන්ද ප්‍රා.ලේ කොට්ඨාශ දෙකක් වෙන් කරන ලදී.

මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ට අදාල ග්‍රා.නි වසම් ගණන

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිළධාරී වසම් ගණන |
|---|---|
| 1. අකුරැස්ස | 46 |
| 2. අතුරලිය | 28 |
| 3. දෙවිනුවර | 41 |
| 4. දික්වැල්ල | 48 |
| 5. හක්මණ | 34 |
| 6. කඹුරුපිටිය | 39 |
| 7. කිරින්ද පුහුල්වැල්ල | 25 |
| 8. කොටපොල | 37 |
| 9. මාලිම්බඩ | 29 |
| 10. මාතර | 66 |
| 11. මුලටියන | 48 |
| 12. පස්ගොඩ | 43 |
| 13. පිටබැද්දර | 40 |
| 14. තිහගොඩ | 40 |
| 15. වැලිගම | 48 |
| 16. වැලිපිටිය | 38 |
| **මාතර දිස්ත්‍රික්කය** | **650** |

අද දක්වා ක්‍රියාත්මක වන පළාත් සභා ක්‍රමය තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පළාත් සභා හා සම්බන්ධීකරණය පවත්වන්නා වූ පරිපාලන ඒකකයක් බවට පත්ව ඇත. වර්තමානයේ මධ්‍යම රජය සහ පළාත් සභාවට සම්බන්ධ මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටුකිරීමේ ප්‍රාථමික හා වැදගත් පරිපාලන ඒකකය බවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පත්ව ඇත.

# Administration

Historical evidences prove the fact that Rohana kingdom of Matara which was a region with a proper administrative system had been a prosperous region since the beginning of Aryan civilization before 543 B.C. It is revealed that King Weera Parakrama who ruled in Kotte kingdom in 15th century had divided the kingdom into 6 areas namely Sath Korale, Satara Korale, Thun Korale, Denawaka, Raigama and Matara for the convenience of ruling. Matara area had been ruled by a divisional leader appointed by the King.

During the period of foreign invasion in Sri Lanka Matara had been identified by Portuguese as an important commerce center. As a result of the attempt made to win divisional rulers towards Kingdom of Kotte was totally invaded by Portuguese and they divided into four parts as Sabaragamuwa, Satara Korale,Sathkorale and Matara. Matara was the largest and most prosperous zone which belonged to Kotte Kingdom was called as 'Matara Deepavaniya'.

At that period of time the chief regional administrator was Government Agent and only Sinhala Government Agent during Portuguese period was Don Fernando Samarakoon who was a person in the Matara area. He was efficient and clever among other rulers of Kotte Kingdom and was also awarded the title of Knight. For his assistance Divisional Revenue Officers and Vidanes at rural level performed their duty. (In the upcountry they were called as Korale) In the feudalism providing services to the king could also be seen in the area of Matara.

In the Dutch rule in 18th Century coastal areas were divided into Three ruling areas namely Galle, Colombo and Jaffna. Galle administrative area covered a vast area from Walawe River to Benthara River and Matara was also included in it. Again Matara administrative division was divided into 05 revenue divisions.

British invaded coastal area in the year 1789, upcountry in 1815. They appointed Colebrook commission in 1829 to properly rule the area. Based on the proposal made by that Commission Local Government Authorities ruled by the Government were established according to re-blocked administrative divisions. An agent was appointed for these provinces and every province was divided into a few districts and sub agent was appointed.

In the year 1833, area from Benthara river to Kumbukkan Oya became an administrative division in the name Southern province.

This Southern Province was again divided into 05 divisions of Sub Agent. They are Galle, Ratnapura, Matara, Pahala Uva and Hambantota. But in 1845 Ratnapura joined Sabaragamuwa Province while Pahala and Uva Wellassa to Central Province. Current Southern province (consisted of Matara, Galle and Hambantota districts) was absolutely decided in 1881.

By the time of 1890, Matara District functioned as a sub agent division which is responsible to Provincial Agent. Matara District was divided into 05 administrative divisions and Five Mudalis were appointed for the assistance of Sub agent. Under the supervision of such Mudalis Widane Arachchis were appointed as one for 10 villages. A part thereof was introduced as Walakada. Under them 'Police Village Headmen' positions functioned at village level. In Matara district with such an administrative structure there was total peaceful ruling and prosperous. In that structure the highest regional post of headman was Mudali who was in charge of a Pattu or Korale.

At that time Mudalies functioned as in charge officers of following korales and Pattus.

1. Weligam Korale
2. Morawak Korale
3. Gangabada Pattu
4. Wellabada Pattu
5. Kandabada Pattu.

Mudalies were selected from educated and wealthy families of the area by District agents. On the other hand Widane Arachchis were selected by Mudalies from families with a good socio economic background. Their social status was much more helpful uplift agriculture and maintain a peaceful administration at rural level.

With the changes emerged with the Donamor Constitution in the year 1931 Divisiional Revenue Officers were appointed through examinations and positions of Mudalies were cancelled. Rathnayaka Mudali who ruled Gangabada Pattu can be introduced as the final Mudali in Matara District.

On the other hand positions of Widane Arachchi and Police headmen created. In 1961 system of Village Headman was also changed. Posts of Grama Niladaries which were selected from an competitive examination were created. As a result, Revenue administrative officers for 5 revenue administrative divisions and Grama Niladaries were appointed at village level. They provided their service to Government Agent of the district. Although the administration of the country is smoothly fulfilled, contribution of the Government was minimum in the development activities. Donamor

rulers understood this situation and therefore appointed Government Agent as the District development officer in the development process of the district. Through this it was specially expected to accelerate agricultural development activities needed for the general public.

After the independence in 1948, Sri Lankan people received franchise. Need of understanding people's problems arose. Since the ruling system was not sufficient for that purpose District political method was set up in 1973 as the second step of decentralizing administration at divisional level.

The headquarters of the political authority was Kachcheri and Agent of Matara District was appointed as the secretary thereof. Later posts changed as Revenue Administrative Officer and Assistant Government Agent.

Lack of financial resources needed for rural development was a major issue even in this system. In order to avoid this situation, powers of political authority could be strengthened by introducing decentralized budget system. Through this system politicians received opportunity to act similar to Assistant Government Agent in preparing development programs for decentralized budget at district electorates.

However by this period, 5 Revenue Officers Divisions increased to 11 in the Matara district. Later they were named as Assistant Government Agent Offices taking into consideration the role thereof.

1. Wellabada Pattu East (Dickwella)
2. Wellabada Pattu & Four Gravets (Matara & Devinuwara)
3. Gangabada Pattu South (Thihagoda)
4. Gangabada Pattu North (Kamburupitiya)
5. Kandabada Pattu West (Mulatiyana)
6. Kandabada Pattu East (Hakmana)
7. Morawak korale East (Pasgoda)
8. Morawak Korale West (Kotapola & Pitabaddara
9. Weligam Korale North (Akuressa)
10. Weligam Korale South (Malimbada)
11. Weligam Korale West (Weligama & Welipitiya)

Wellabada Pattu and Four Gravets was again changed as Wellabada Pattu South (Devinuwara). Number of Grama Niladaries divisions increased up to 225.

By the year1978, political authority was changed by the then Government as District Minister system. Mr. Keerthi Abeywickrama appointed as the first District Minister of Matara District. Government Agent was officially appointed as the Secretary of the District Minister. Through this it was expected to plan development programs suitably to existing administrative pattern.

By the period of 1981, the then Government introduced District Develoopment Sabha system. Representatives were elected for 06 seats in Matara District. Chairman for that Sabha was elected based on their consent and power of political.

225 Gramodaya Mandala were appointed as one for each Grama Niladari Division. Pradeshiya Mandalas were set up for every Division of Assistant Government Agent. Even in the implementation of development activities of these Development Sabhas the relationship between District Minister and District Development Sabhas was very weak.

In 1987 system of provincial council was introduced by Provincial Council Act of 1987 as the forwarding step of decentralizing administration. It paid a strong foundation to decentralize powers of central government at provincial level and even today that system is functioning. Southern Provincial Council set up under this system consisted of a Chief Minister and Four other ministers. In the year 1987, 07 representatives from Matara District were elected for Provincial Council.

A change of the administrative system of the district could be seen by 1992. System of Kachcheri was cancelled and instead District Secretary and Government Agent became District Secretary. Divisions of Assistant Government Agent became Divisional Secretariat while Assistant Government Agent became Divisional Secretary. On the other hand position of Grama Sewaka became the position of Grama Niladari. Minor Urban Councils of Akuressa and Devinuwara were cancelled and only Weligama Urban Council remained so. Gramodaya Mandala were cancelled and instead Pradeshiya Sabhas were formed with representatives elected by voting.

By 1992 in addition to 12 Divisional Secretary’s divisions in Matara District, Pitabaddara Divisional Secretariat from Kotapola Divisional Secretariat and Welipitiya Divisional Secretariat from Weligama Divisional Secretariat formed. Then these two sub divisions became Divisional Secretariats. By the end of the year 1999 number of Divisional Secretariats of Matara District increased up to 16. Two Divisional Secretariat were separated as Kirinda Puhulwellla comprising parts of Hakmana and Kamburupitiya Divisional Secretariats and Athuraliya Divisional Secretariat was formed from Akuressa Divisional Secretariat.

Within the existing system of Provincial Councils, Divisional Secretariat has become the administrative unit which makes the coordination with Provincial Councils. Further it has become the primary and important administrative unit that fulfills requirements of the general public related to Central Government and Provincial Councils.

No. of Grama Niladari Divisions belonged to Divisional Secretary's Divisions of Matara District.

| Divisional Secretary's Division | No. of Grama Niladari's Divisions. |
|---|---|
| 1. Akuressa | 46 |
| 2. Athuraliya | 28 |
| 3. Devinuwara | 41 |
| 4. Dickwella | 48 |
| 5. Hakmana | 34 |
| 6. Kamburupitiya | 39 |
| 7. Kirinda Puulwella | 25 |
| 8. Kotapola | 37 |
| 9. Malimbada | 29 |
| 10. Matara | 66 |
| 11. Mulatiyana | 48 |
| 12. Pasgoda | 43 |
| 13. Pitabaddara | 40 |
| 14. Tihagoda | 40 |
| 15. Weligama | 48 |
| 16. Welipitiya | 38 |
| Matara District | 650 |